# ප්‍රසම්පාදන දැන්වීම

# ශික්ෂණ රෝහල - කුරුණෑගල.

මෙම රෝහලේ පහත සඳහන් ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් ඉටු කිරිම සඳහා **ICTAD /CIDA** වලංගු සාමාජිකත්වය දරණ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2023.06.26 දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර් කැඳවනු ලබන අතර ටෙන්ඩර් විවෘතය එදින එම වේලාවට අධ්‍යක්ෂ නිළ කාර්යාලයේදී සිදු කෙරේ. එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

2023.06.23දින ප.ව.3.00 දක්වා සතියේ රාජකාරි දිනයන්හිදී නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කල හැකි අතර එදින එම වේලාව තෙක් පහත ලිපි ලේඛන ඉදිරිපත් කර ලංසු ලේඛන ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක.

1. අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, කුරුණෑගල වෙත ඉදිරිපත් කරන ලිඛිත අයදුම්පතක්
2. එක් වැඩ විෂයයක් වෙනුවෙන් නියමිත ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල රෝහල් මුදල් අයකැමි වෙත ගෙවා ලබා ගත් රිසිට්පත
3. පිටපතක් සමඟ ICTAD /CIDA ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත
4. පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන ජේදය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරනලද ලියාපදිංචි සහතිකය (ලංසු ලේඛන නිකුත් කිරීම සඳහා පමණක් සහතිකය සඳහා ගෙවීම් සිදු කල ලදුපත පිලිගනු ලැබේ.)

ටෙන්ඩර්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි වැඩ විෂයෙහි නම පැහැදිලිව සටහන් කරන ලද ඔබගේ ටෙන්ඩර්පත සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,ශික්ෂණ රෝහල, කුරුණෑගල ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් එවීමට හෝ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීමට හැකි අතර මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වෙතොත් 037 – 2233906 මඟින් අංක 2800 අමතා ලබා ගත හැක.

| අනු අංකය | වැඩ විෂය | ඇස්තමේන්තු වටිනාකම | ශ්‍රේණිය | ලංසු සුරක්ෂිත ඇපකරයේ වටිනාකම රු. ශත. | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. ශත. |
|---|---|---|---|---|---|
| 01. | ඖෂධ ගබඩාවේ බිම් මහලේ තීන්ත ආලේප කිරීම සහ විදුලි වැඩ සිදු කිරීම. | රුපියල් මිලියන 5.5 | C6 , C7 | 55,100.00 | 2500.00 |
| 02. | ශල්‍ය සායන ගොඩනැගිල්ලේ බිම් මහල ඉදි කිරීම. | රුපියල් මිලියන 24.9 | C5 , C6 | 250,000.00 | 4000.00 |

සභාපති
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව
ශික්ෂණ රෝහල,
කුරුණෑගල